*සැ. යු.*- 2013.11.15 දින පළ වූ අංක 1,837 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,838 - 2013 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2013.11.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1842 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1848 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 දෙසැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1839 - B 80786—3,800 (2013/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මඩකලපුව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 දෙසැම්බර් මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මඩකලපුව | මන්මුනායි දකුණ සහ එරුවිල් පත්තු | කලුදාවලෙයි කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ මන්මුනායි පත්තු දකුණ සහ එරුවිල් පෝරතිවු පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |

11-751

---

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ (හදිසි) මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

කොළඹ නාගරික සීමාවේ පුරප්පාඩුවී ඇති හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර "ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12" වෙත 2013.12.06 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "(හදිසි) මරණ පරීක්ෂක තනතුර "කොළඹ නාගරිකය." යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙකී තනතුර සඳහා හදිසි මරණ පරීක්ෂවරුන් 05 දෙනෙකු බඳවාගනු ලබන අතර එක් අයෙකුට සතියේ එක් දිනක් සේවය කිරීමට සිදුවනු ඇත.

04. පෙ. ව. 8.30 සිට ප. ව. 6.00 දක්වා නාගරික හදිසි මරණ පරීක්ෂක කාර්යාලයය විවෘතව තැබිය යුතු අතර හදිසි මරණ පරීක්ෂණයක් සඳහා කැඳවීමක් ලද ඕනෑම අවස්ථාවක පැමිණීමට හැකියාව තිබිය යුතුය.

05. මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවේ. මෙම තනතුරට පත් කරනු ලබන දින සිට වසර පහකට බලපවත්නා පරිදි පත් කරනු ලබන අතර, ඉන්පසුව අදාළ නිර්දේශයන් සහ වෛද්‍ය සහතික සලකා බැලීමෙන් පසුව සෑම වසර පහකට වරක් දීර්ඝ කරනු ලැබිය හැකිය. එහෙත් එම තනතුර දැරීමේ උපරිම වයස් සීමාව අවුරුදු 70 නොඉක්මවිය යුතුය. එහෙත් ඉන් පෙර ඕනෑම අවස්ථාවක (හදිසි) මරණ පරීක්ෂකවරයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් සේවයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

06. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව (හදිසි) මරණ පරීක්ෂකවරුන්ගේ කාර්යයන් පත්වීම්ලාභීන් විසින් ඉටු කළ යුතුවේ.

07. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එසේ වුව ද මරණ පරීක්ෂණයක් සඳහා රු. 500 ක ගාස්තුවක් ද, මරණ පරීක්ෂකවරුන් සඳහා අනුමත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ද ගෙවනු ලැබේ.

08. පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති අයවලුන්ට පමණක් අයදුම් කළ හැක.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) කොළඹ නගර සහ ප්‍රදේශයේ පසුගිය වසර දෙක තුළ ස්ථිර පදිංචිකරුවකුව සිටීම

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

(ඈ) වසර 4කට නොඅඩු කාලයක් නීතිඥයකු ලෙස කටයුතු කර තිබීම

(ඉ) මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු විය යුතුය. මත්පැන් පාවිච්චියෙන් සහ දුම්පානයෙන් තොර තැනැත්තන් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.

09. අයදුම්පත් භාරගන්නා අවසන් දින වනවිට රජයේ, පළාත් සභා අරමුදලකින් හෝ පළාත් පාලන ආයතනයක අරමුදලකින් වැටුපක් හෝ

දීමනාවක් ලබන තැනැත්තන් ද, රාජ්‍ය සංස්ථාවල සහ සමූපකාර සමිතිවල සේවකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ද, පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පළාත් පාලන ආයතනවල සභිකයන් ද මෙම තනතුර සඳහා අයදුම් කිරීමට නුසුදුස්සෝ වෙති.

10. ඉල්ලුම් පත්‍රය සමඟ කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය. එසේ වුව ද සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් සියලුම සුදුසුකම් සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කල යුතු අතර, පහත දැක්වෙන ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) ජාතික හැඳුනුම්පත
(ඈ) ස්ථිර පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය
(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
(ඊ) අතිරේක සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඇති වෙනත් සහතික තිබේ නම් එම සහතික
(උ) විශ්‍රාමික අයදුම්කරුවන් විසින් විශ්‍රාම ගත් දිනය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි
(ඌ) නීතිඥ සහතිකය

11. සියලුම අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතියට අනුකූලව පැහැදිලි අකුරින් සම්පූර්ණ කර තිබිය යුතුය. අවශ්‍ය තොරතුරු සියල්ල ඇතුළත් නොකර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ඉල්ලුම්පත් ආකෘති පිරවීමේ දී යෝග්‍යතා නිර්ණායක පිළිබඳ නිවැරදි විස්තර ඇතුළත් කළ යුතුය. ඉහත 07 වැනි ඡේදයේ සඳහන් ගණයකට අයත් හෝ අංක 06 හෝ 08 යන ඡේද සඳහා අසත්‍ය තොරතුරු සපයන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගෙන පත්වීම් දීමෙන් අනතුරුව සත්‍ය තත්ත්වය ඔප්පු වුවහොත් එබඳු අයදුම්කරුවන්ගේ පත්වීම් වහාම අවලංගු කරනු ලැබේ.

13. තව ද හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් පත්කරනු ලැබීමෙන් පසුව ඉහත 07 ඡේදයේ තනතුරකට පත්වුවහොත් එසේ පත්වීම ලද දින සිට මෙකී පත්වීම අහෝසි වේ.

ඩී. එල්. ගුණසේකර,
ලේකම් (වැ. බ.),
අධිකරණ අමාත්‍යාංශය.

2013 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

හදිසි මරණ පරීක්ෂක තනතුර

| දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |
|---|---|---|---|
| අදාළ මහෙස්ත්‍රාත් අධිකරණය | | හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය | |
| අදාළ පොලිස් ස්ථානය | | පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය | |

01. (අ) මුල'කුරු සමඟ නම (පැහැදිලි අකුරෙන්) :————.
(පෙලපත් නාමය යටින් ඉරක් අඳින්න)

(ආ) මුල'කුරු වලින් හැඳින්වෙන නම් :————.

02. ලිපිනය :————.

03. දුරකථන අංකය :————.

04. උපන් දිනය :————.

05. 2013.12.06 දිනට වයස : අවුරුදු :———. මාස :———. දින :———.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් දිනය :————.

08. වෘත්තීය සුදුසුකම් :————.

09 වර්තමාන රැකියාව :————.

10. කලින් කරන ලද රැකියාව :————.

11. (අ) රජයේ/රාජ්‍ය සංස්ථාවක/පළාත් සභාවක, සමූපකාර හෝ පළාත් පාලන ආයතනයක රැකියාවක් කරන්නේ ද? :————.
(ආ) එවැනි සේවයකින් අස්වී/විශ්‍රාම ගොස් ඇත්නම්, අස්වීමට/විශ්‍රාම යාමට හේතුව :————.
(ඇ) අස්වීම/විශ්‍රාම යාම අනුමත කළ දිනය :————.

12. (අ) ඔබට විරුද්ධව කිසියම් කලක සේවා යෝජකයා විසින් විනයානුකූලව කටයුතු කර තිබේ ද? :————.
(ආ) එසේ නම්, චෝදනාවේ ස්වභාවය හා ප්‍රතිඵලය :————.

11-660

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා විද්‍යාගාර අධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2013

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් දැනට රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලාංකේය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

භාෂා විද්‍යාගාර අධිකාරී - තනතුරු 01

02. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

03. මාසික වැටුප් පරිමාණය : රු. 20,030 - 11 x 365 - 18 x 500 - රු. 33,045/- (MN-7-2006(A)

04. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

05. සුදුසුකම් : භාෂා විද්‍යාගාර අධිකාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

5.1 අධ්‍යාපන සුදුසුකම් :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම භාෂාවක් විෂයයක් සහිතව ලබාගත් උපාධියක් තිබීම;

*හා*

ඉංග්‍රීසි භාෂාව සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විශිෂ්ට සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

5.2 පළපුරුද්ද :

භාෂා විද්‍යාගාර පරිහරණය පිළිබඳ රජය පිළිගත් ආයතනයක වසර තුන (03)ක පළපුරුද්දක් තිබිය යුතුය.

5.3 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.4 වෙනත් :

1. MN-4, MN-5 හා MN-6 වැටුප් පරිමාණවල සේවය කරන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් වීම.
2. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම ම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

6.1 වෘත්තීය පරීක්ෂණය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| * භාෂා විද්‍යාගාරයේ පරිගණක පද්ධතිය (Network System) ක්‍රියාත්මක කිරීම | 50 |
| * භාෂා පාඨමාලා වලට අදාළ පාඩම් පිළියෙල කිරීම | 50 |
| එකතුව | 100 |

සමත් ලකුණු ප්‍රමාණය 40% කි.

6.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| * අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| * අතිරේක පළපුරුද්ද | 35 |
| * වෘත්තීය සුදුසුකම් | 35 |
| * සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |
| එකතුව | 100 |

ලකුණු පරිපාටිය :—

*ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා :*

| | |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 25) | (i) භාෂාවන්ට අදාළව පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීම - ලකුණු 25<br>(ii) වෙනත් ඕනෑම පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීම - ලකුණු 15<br>(iii) ඕනෑම පශ්චාත් ඩිප්ලෝමා සුදුසුකමක් ලබා තිබීම - ලකුණු 10<br>(උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) |
| 2. අතිරේක පළපුරුද්ද (උපරිම ලකුණු 35) | (i) භාෂා විද්‍යාගාරය පිළිබඳ පළපුරුද්ද, අනිවාර්ය වසර 03ට අමතරව වැඩිවන එක් වසරකට ලකුණු 05 බැගින් වසර 05ක් සඳහා - ලකුණු 25<br>(ii) අමතරව භාෂාවකට ලබාගත් ඩිප්ලෝමා මට්ටමේ සුදුසුකම් - ලකුණු 10 |
| 3. වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු 35) | (i) අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ලබා තිබීම - ලකුණු 20<br>(ii) අධ්‍යාපනය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් - ලකුණු 10<br>(iii) වැඩිහිටි අධ්‍යාපන පාඨමාලාවල ලබා ගත් පළපුරුද්ද - ලකුණු 05 |
| 4. සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන ලද කුසලතාව (උපරිම ලකුණු 05) | නායකත්ව පෞරුෂය, ඉදිරිපත් කිරීමේ විලාසය ආදී කරුණු ගැන අවධානය යොමු කෙරේ - ලකුණු 05 |

*වෘත්තීය පරීක්‍ෂණය සඳහා :*

| | |
|---|---|
| 1. භාෂා විද්‍යාගාරයේ පරිගණක පද්ධතිය (Network System) ක්‍රියාත්මක කිරීම (උපරිම ලකුණු 50) | (i) දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් සම්පාදනය කිරීමේ හැකියාව - ලකුණු 25<br>(ii) භාෂා විද්‍යාගාරයේ පරිගණක පද්ධතිය මෙහෙයවීම - ලකුණු 10<br>(iii) කාර්යාලයීය කටයුතු සඳහා පරිගණක භාවිතයේ හැකියාව (MS Office Package) - ලකුණු 10<br>(iv) පරිගණක දෘඪාංග පිළිබඳ සාමාන්‍ය දැනුම - ලකුණු 05 |
| 2. භාෂා පාඨමාලාවලට අදාළ පාඩම් පිළියෙල කිරීම (උපරිම ලකුණු 50) | (i) ඉලක්ක කණ්ඩායමක් සඳහා භාෂා පාඨමාලාවක විෂයමාලා සැලසුමක් ඉදිරිපත් කිරීම - ලකුණු 30<br>(ii) එහි පළමු පාඩම (Lesson Plan) ඉදිරිපත් කිරීම - ලකුණු 20 |

*සටහන* :- ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය හා වෘත්තීය පරීක්‍ෂණය යන දෙකෙහි ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

07. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතු ය. මෙම බඳවා ගැනීමේ පරීක්‍ෂණයේ නීති රීති අනුව යම් අපේක්‍ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්‍ෂණයට පෙර හෝ පැවැත්වෙද්දී හෝ පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්‍ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

08. අයදුම්පත්‍ර A4 (සෙ. මී. 24 x 29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(*අ*) අංක 1 සිට 3.4 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
(*ආ*) අංක 4 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු ය.
(*ඇ*) අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය,

8.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "භාෂා විද්‍යාගාර අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2013" යන්න සඳහන් කරන්න.

8.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2013.12.17 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට තැපෑලෙන් යැවිය යුතු ය.

රාජ්‍ය භාෂා කොමසාරිස්,<br>
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,<br>
341/7, භාෂා මන්දිරය,<br>
කෝට්ටේ පාර,<br>
රාජගිරිය.

8.3 සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

09. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්. එස්. වික්‍රමසිංහ,
ලේකම්.

2013 නොවැම්බර් මස 01 වැනි දින,
ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය,
41, බුත්ගමුව පාර,
රාජගිරිය.

### *භාෂා විද්‍යාගාර අධිකාරි තනතුර සඳහා අයදුම්පත්‍රය*
### Application for the Post of Superintendent of Language Laboratory

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

[ ]

1. නම :

1.1 මුලකුරු සමග නම Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2. ලිපිනය :

2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 රාජකාරි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 ප්‍රවේශපත් එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී -1 පුරුෂ - 0 [ ] (අදාළ අංකය ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක -1 අවිවාහක -2
[ ]
(අදාළ අංකය ලියන්න)

3.3 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.4 2013.12.17 දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4. අධ්‍යාපන සුදුසුකම් :

4.1 (*a*) උපාධිය :————.
(*b*) උපාධිය ලබා ගත් වර්ෂය හා විශ්වවිද්‍යාලය :————.
(*c*) උපාධියට හැදෑරූ විෂයයන් :————.

4.2 අ. පො. ස. (උ. පෙළ) :

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3 අ. පො. ස. (සා. පෙළ)

| *විෂයයන්* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

5. පළපුරුද්ද :————.

6. 6.1 සේවය/තනතුර :————.

6.2 පන්තිය :————.

6.3 2013.11.22 වැනි දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) රජය යටතේ මුළු සේවා කාලය

අවුරුදු : ☐ මාස : ☐

6.4 දැනට වාර්ෂික වැටුප රු. :————.

6.5 වැටුප් කාණ්ඩය :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ එය පැවැත්වෙද් දී හෝ ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මා එකඟ වෙමි.

2013 ………… දිනට පූර්වාසන්නයෙන් වූ වසරවල වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් මම ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ……………………………… මයා/මිය/මෙනවිය ………… දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත් ඉහත සඳහන් තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූබවත් ඒවා නිවැරදි බවත් 2013 ………… මස ……… දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව :————.
දිනය :————.

11-762

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 දෙසැම්බර් මස 23 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 නොවැම්බර් මස 07 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
| --- | --- | --- | --- |
| අම්පාර | අක්කරපත්තුව | අම්පාර දිස්ත්‍රික්කයේ පට්ටියාඩිපිට්ටි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |

11-822

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රත්මලාන ජාතික වෘත්තීය පුහුණු ආයතනය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

***2014 වර්ෂය (ජනවාරි) සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

ඉහත සඳහන් පාඨමාලා, සඳහා තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :

අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

* පාඨමාලා අංක 01, 02, 03, 04, 06, 08, 10, 11, 15, 17 සඳහා අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත්ව තිබීම,
* පාඨමාලා අංක 05 සඳහා අ. පො. ස. (උ. පෙළ) ගණිතය හෝ විද්‍යා විෂයයන් හදාරා තිබීම හෝ අ. පො. ස (සා/පෙළ) ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි විෂයයන් සඳහා A සාමාර්ථ ලබා තිබීම,
* අනෙකුත් සියලුම පාඨමාලා සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටීම.
* අපේක්ෂකයාගේ දැනුම, ආකල්ප හා පාඨමාලාවට ඇති ලැදියාව පදනම් කරගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

ඉහත පාඨමාලා හදාරණ ඔබට/ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම්

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් (පිරිමි) සඳහා නේවාසික පහසුකම්;
* රැකියා ලොව ඉහළ පිළිගැනීමට ලක් වූ ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය නිපුණතා සහතික (NVQ Level);
* වෘත්තීය මාර්ගෝපදේශන සහ ව්‍යවසායකත්ව දැනුම;
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්;
* නායකත්ව හා පෞරුෂත්ව වර්ධන වැඩසටහන්;
* සෑම පාඨමාලාවක් සඳහාම නොමිලේ ඉංග්‍රීසි දැනුම.

*විශේෂයි*

* පුහුණුවෙන් පසු අනිවාර්යයෙන් රැකියාවක්;
* කාර්මික පාඨමාලාවන් සඳහා කාන්තා අයදුම්කාරියන්ට ප්‍රමුඛත්වය;
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය.

*පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම*

* ඔබ හැදෑරීමට කැමැති පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන් ඇතුළත් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතක් 2013.12.30 වැනි දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100, කඳවල පාර,
රත්මලාන.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

දුරකථන අංක : 0112 638850/0112633136,
ෆැක්ස් : 0112 638850.
විද්‍යුත් තැපැල : nvtirathmalana@vtasl.gov.lk

| *අංකය* | *පාඨමාලාව (පූර්ණ කාලීන)* | *මට්ටම* | *පුහුණුව (මාස)* | | *පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්තු* | |
|---|---|---|---|---|---|---|
| | | | *ආයතනික* | *වැඩ බිම* | *ලියාපදිංචි ගාස්තු රු. ශත* | *පාඨමාලා ගාස්තු රු. ශත* |
| 1 | පරිගණක දෘඩාංග කාර්මික ශිල්පී (Computer Hardware) | NVQ Level 4 | 6 | 6 | 500 0 | 7,500 0 |
| 2. | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී (Information and Communication Technology (ICT) | NVQ Level 4 | 6 | 6 | 500 0 | 7,500 0 |
| 3. | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී (Graphic Designer) | NVQ Level 4 | 6 | 6 | 500 0 | 10,000 0 |
| 4. | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහතික පත්‍ර පාඨමාලාව National Certificate in Information and Communication Technology - NCICT) | NVQ Level 4 | 6 | 6 | 500 0 | 7,500 0 |
| 5. | ප්‍රමාණ සමීක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in Quantity Surveying) | | 12 | 12 | 500 0 | 60,000 0 |
| 6. | සැලසුම් ශිල්පී සහතිකපත්‍ර පාඨමාලාව (Draughtsmanship) | | 12 | 12 | 500 0 | 5,000 0 |
| 7. | වඩු කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) (Carpenter-Furniture) | NVQ Level 4 | 12 | 12 | 500 0 | නොමිලේ |
| 8. | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී (Automobile Electrician) | NVQ Level 4 | 12 | 12 | 500 0 | 5,000 0 |
| 9. | මෝටර් රථ වැද්දුම් ශිල්පී (Automobile Tinker) | NVQ Level 4 | 6 | 6 | 500 0 | නොමිලේ |
| 10. | විදුලි කාර්මික ශිල්පී (කර්මාන්ත) (Electrician) | NVQ Level 4 | 12 | 12 | 500 0 | 5,000 0 |
| 11. | ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී (Refrigeration and Air Conditioning Mechanic) | NVQ Level 3 | 12 | 12 | 500 0 | 3,000 0 |
| 12. | යන්ත්‍රණ ශිල්පී පාඨමාලාව (Machinist-General) | NVQ Level 3 | 12 | 12 | 500 0 | 3,500 0 |
| 13. | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී (Aluminum Fabricator) | NVQ Level 3 | 6 | 6 | 500 0 | නොමිලේ |
| 14. | උද්‍යාන අලංකරණ සහතිකපත්‍ර පාඨමාලාව(Landscapist) | | 6 | 6 | 400 0 | නොමිලේ |
| 15. | කර්මාන්තශාලා උපකරණ ශිල්පී (Industrial Instrument Technician) | | 12 | 12 | 500 0 | 6,000 0 |
| 16. | පෑස්සුම් ශිල්පී (Welder) | NVQ Level 4 | 12 | 12 | 500 0 | 3,000 0 |
| 17. | ගොඩනැගිලි පින්තාරු ශිල්පී (Building Painter) | NVQ Level 3 | 6 | 6 | 500 0 | නොමිලේ |
| 18. | ගුවන් විදුලි, රූපවාහිණී හා ආශ්‍රිත උපකරණ අළුත් වැඩියා ශිල්පී (Radio, TV and Allied Equipment repair) | NVQ Level 4 | 18 | 12 | 500 0 | 4,000 0 |

11-761

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය-නාරාහේන්පිට**

***2014 වසරේ පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

**පූර්ණ කාලීන පාඨමාලා**

| *No.* | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D | 12,000 |
| 2 | CCNA Academy Program | Non | 6 | D | 40,000 |
| 3 | Computer Graphic Designer | IV | 6 | H | 12,500 |
| 4 | Adobe Certified Professional | Non | 6 | G | 15,000 |
| 5 | NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | D | 7,500 |
| 6 | NVQ - V in ICT with free CISCO IT Essential A + & ORACAL Academy Certification Training** | V | 12 | M | 40,000 |
| 7 | Computer Graphic Designer (ශ්‍රවණාබාධිත) | IV | 6 | - | Free |
| 8 | Diploma in Drafting Technology | Non | 12 | N | 20,000 |
| 9 | Diploma in Quantity Surveying | V | 12 | O | 60,000 |

| *No.* | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|---|---|
| 10 | Baker | IV | 6 | B | 30,000 |
| 11 | Cook | IV | 6 | B | 30,000 |
| 12 | Waiter/Steward | III | 6 | B | 4,500 |
| 13 | Automobile Mechanic | IV | 18 | A | 6,000 |
| 14 | Automobile A/C Mechanic | IV | 6 | B | 3,000 |
| 15 | Beautician | IV | 6 | B | 20,000 |
| 16 | Hairdresser | IV | 6 | B | 30,000 |
| 17 | Advanced Diploma in Cosmetology | Non | 6 | F | 40,000 |
| 18 | Diploma in Industrial Management | Non | 6 | E | 25,000 |
| 19 | Electrician | IV | 12 | A | 5,000 |
| 20 | Offset Lithographic Operator | II | 6 | B | 3,500 |
| 21 | Machinist (CNC Milling) | IV | 6 | C | 6,000 |
| 22 | Driver (Light Vehicle) | Non | 3 | - | 10,500 |

අර්ධ කාලීන පාඨමාලා

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 150 | A | 12,000 |
| CCNA Academy Program | 300 | G | 40,000 |
| Web Designing & Development | 150 | A | 10,000 |
| PC Based Application Assistant (MS Office) | 100 | B | 8,000 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 18,000 |
| ICT Technician (NVQ IV) | 350 | O | 18,000 |
| IC3 +International Certificate* | 120 | K | 19,000 |
| CCN Security | 150 | P | 20,000 |
| Auto Cad (2D)* | 100 | L | 9,000 |
| Auto Cad (3D)* | 70 | L | 6,500 |
| Baker | 120 | B | 20,000 |
| Quantitiy Surveryor | 80 | L | 15,000 |
| Auto Mobile Technician (Engine/Petrol/Diesel) | 160 | I | 10,500 |
| Electrician (Domestic) | 100 | A | 10,200 |
| Motor Winder | 100 | B | 9,000 |
| Draughtsman ship (Civil/Mechanical/Electrical) | 180 | D | 15,000 |
| Japanese Language* | 100 | B | 10,500 |
| CNC Programming | 125 | B | 9,000 |
| English Language | 100 | B | 10,500 |

* *සන්ධ්‍යා කාලීනවද පැවැත්වේ.*

** Conditions Apply

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2013.12.30 වැනි දිනට වයස අවු. 16ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාදා/ඉරිදා දිනයන්හි පැවැත්වේ.

*ප්‍රතිලාභ :*

- දේශීය - විදේශීය රැකියා අවස්ථා.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්.
- ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක්.
- විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම.
- දීමනා සමඟ මාස 06ක වැඩිදුර පුහුණුව.

සුදුසුකම් :

A. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම.

B. අ.පො.ස. (සා/පෙළ) දක්වා හදාරා තිබීම.

C. අ.පො.ස. (සා/පෙළ) විෂයන් 06 කින් සමත් වී තිබීම සහ යන්ත්‍රණය NVQ Level III පාඨමාලාවක් හදාරා තිබීම.

D. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06 කින් සමත් වීම.

E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්‍ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්‍ෂේත්‍රයේ වැඩ මූලික/ වැඩ මූලික සහායක/ වැඩ අධීක්‍ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.

F. ජාතික වෘත්තීය සුදුසුකම් III, IV (Hairdresser/Beautician) සහතිකය තිබීම.

G. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව සමත් වීම.

H. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

I. නවය වසර සමත් වීම.

J. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව සම්මාන සහිතව සමත් වී තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැළී සිටීම.

K. අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයන් 06 කින් සමත් වීම.

L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.

M. ජාතික තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම හෝ රජය පිළිගත් පූර්ණ කාලීන හය මාසික පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

N. අ. පො. ස. (උ/පෙළ) විෂයන් 3කින් සමත්වී තිබීම

O. අ.පො.ස.(උ. පෙළ) ගණිතය, විද්‍යාව විෂය ධාරාවක් හදාරා තිබීම හෝ සැලසුම් ශිල්පී සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

P. CCNA පාඨමාලාවක් හදාරා තිබීම.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2013.12.30 වැනි දිනට පෙර පහත ලිපිනයට එවන්න.

සහකාර අධ්‍යක්‍ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථන අංක : 011-2592233, 011-7277111 (IT Center)
ඊ-මේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112553856

11-849

---

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බාහිර අයැදුම්කරුවන් බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - 2013**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2012.11.23 හා 2013.09.13 යන දිනයන්හි පළ කරන ලද *ගැසට් නිවේදන* වල 04 (ආ) හි සඳහන් වෘත්තීය සුදුසුකම් පහත පරිදි සංශෝධනය කෙරේ. ඒ අනුව මේ සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.11.29 දක්වා දීර්ඝ කරන බව දන්වමි.

"රත්මලාන ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ හෝ රජයේ කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය යටතේ ඇති කාර්මික විද්‍යාලයක හෝ වෙනත් එවැනි ආයතනයක දෑ අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. මෙම පාඨමාලාව ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) හෝ හය (06) මට්ටම් විය යුතුය."

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

11-768

## ශ්‍රී ලංකා කාර්මික පුහුණු ආයතනය

දියගල ළමා නගරය - රාගම

*නවක සිසුන් බඳවා ගැනීම - 2014/2015 වසර සඳහා*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඉහත පුහුණු ආයතනයට සිසුන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

*පූර්ණ කාලීන පාඨමාලා.-*

| අංකය | පාඨමාලාවේ නම | පාඨමාලා ගාස්තු | කාලය |
|---|---|---|---|
| 01 | යාන්ත්‍රික ශිල්පය | 4,500/- | මාස 12 |
| 02 | විදුලි ශිල්පය | 4,000/- | මාස 12 |
| 03 | පැස්සුම් ශිල්පය | 6,000/- | මාස 12 |
| 04 | මෝටර් කාර්මික ශිල්පය | 5,000/- | මාස 12 |
| 05 | කෘෂිකර්ම ඩිප්ලෝමාව (T.V.E.C. ලියාපදිංචි) | 2,000/- (මාසික) | මාස 12 |
| 06 | බේකරි (සංචාරක හෝටල්) ශිල්පය | 5,000/- | මාස 06 |
| 07 | වඩු කාර්මික ශිල්පය (ගෘහ භාණ්ඩ/ගොඩනැගිලි) | 2,500/- | මාස 06 |
| 08 | විදුලි මෝටර් එතීම | 4,500/- | මාස 06 |
| 09 | Cook | 8,000/- මෙම පාඨමාලා තුනම එකවර කළ හැක. | අවුරුදු 01 |
| 10 | House Keeping | | |
| 11 | Steward | | |

*සති අන්ත පාඨමාලා.-*

| අංකය | පාඨමාලාවේ නම | පාඨමාලා ගාස්තු | කාලය |
|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණ ශිල්පය | 6,500/- | පැය 120 |
| 02 | පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | 15,000/- | පැය 400 |

*අවශ්‍ය සුදුසුකම් :*

*සති අන්ත පාඨමාලා සඳහා.-*

01. පාඨමාලාවට අදාළ ක්ෂේත්‍රයක රැකියාව කිරීම.

02. පාඨමාලාව හැදෑරීමට ඇති දැඩි කැමැත්ත.

*පූර්ණ කාලීන පාඨමාලා සඳහා.-*

*අංක 1,2,4,5,6,10,11 හා 12 සඳහා :*

අ.පො.ස. සා/පෙළ විෂයයන් 06ක් සමත් වීම.

*අංක 03,08,09 සඳහා :*

11 ශ්‍රේණිය දක්වා ඉගෙනීම

*පුහුණුවත් සමග ඔබට :-*

01. ඩිප්ලෝමා, උපාධි මට්ටමට යාමේ අවස්ථාව.

02. නිපුණතා පාදක ක්‍රමය යටතේ (C.B.T.) පාඨමාලා හැදෑරීමට අවස්ථාව,

03. වෘත්තීය මාර්ගෝපදේශනය,

04. නායකත්ව හා පෞරුෂ සංවර්ධනය.

*පුහුණුවෙන් පසු :-*

1. නුවරඑළිය සංචාරක හෝටලයක පුහුණුව,
2. දේශීය හෝ විදේශීය රැකියා අවස්ථා,
3. N.V.Q සහතිකය,
4. දීමනාවක් සමග වැඩිදුර පුහුණුව,
5. අනිවාර්ය රැකියාවක්.

ඔබ කැමති පාඨමාලා තුනක් අනුපිළිවෙලින් සඳහන් කර නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම් සමග ඔබේ දුරකථන අංකය ද සඳහන් කොට ඔබ විසින් සකසාගත් අයදුම්පතක් 2013.12.13 වැනි දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

කේ. මිල්ටන්,
පාඨමාලා සම්බන්ධීකාරක.

ශ්‍රී ලංකා කාර්මික පුහුණු ආයතනය,
දියගල ළමා නගරය,
රාගම.

දුරකථන අංක : 0114-817525/0715-331817

11-812

---

## සංශෝධනයයි

### ප්‍රවාහන අමාත්‍යාංශය - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයේ මෝටර් රථ පරීක්‍ෂකවරුන් බඳවා ගැනීමේ තරග විභාගය — 2013

අංක 1836 දරන 2013.11.08 දින *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ, විභාගයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2013 දෙසැම්බර් 20 දක්වා දීර්ඝ කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. එච්. හරිස්චන්ද්‍ර,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

2013 නොවැම්බර් මස 11 වැනි දින,
තැ. පෙ. 533 ඇල්විටිගල මාවත,
කොළඹ 05.

11-887

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.